පරිච්ඡේදය 08

# ආයෝජනය


මෙම පරිච්ඡේදය මගින් පහත දැක්වෙන කරුණු පිළිබඳ ව සාකච්ඡා කෙරේ.

8.1 ආයෝජනය යන්න හැඳින්වීම

8.2 ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේදී සලකා බලන සාධක

8.3 විවිධ ආයෝජන මාර්ග

8.4 ආයෝජන මාර්ගවල ප්‍රතිලාභ





නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## 8.1 ආයෝජනය යන්න හැඳින්වීම

යම් පුද්ගලයෙකු උපයන ආදායම සම්පූර්ණයෙන්ම පරිභෝජනය සඳහා වැය නොකළේ නම් ආදායමෙන් කොටසක් ඉතිරි වේ. එසේ ඉතිරි කරගත් මුදල්, මුදල් වශයෙන්ම තබා ගතහොත් ඒ සඳහා කිසිදු ප්‍රතිලාභයක් හිමි නොවේ. එම නිසා ඉතිරිකරගත් මුදල් යම් ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් ඵලදායී මාර්ගයක යෙදවීමට විවිධ ආයෝජන මාර්ග වැදගත් වේ.

**මෙසේ පුද්ගලයෙකු තමා උපයන ආදායමෙන් ඉතිරි කරගත් මුදල් ප්‍රමාණයක් යම් ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් ඵලදායී මාර්ගයක යෙදවීම ආයෝජනය නම් වේ.**

## 8.2 ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේදී සලකා බලන සාධක

විවිධ ආයෝජන මාර්ග අතුරෙන් සුදුසු ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේ දී පහත සඳහන් ප්‍රධාන සාධක පිළිබඳ ව සලකා බලනු ලැබේ.

P ආයෝජනයෙහි අරමුණ

ආයෝජනය සිදු කරනුයේ කුමන අරමුණක් සඳහා ද යන්න මෙහි දී සලකා බැලේ.

P ආයෝජනයෙහි අවදානම

තමන් ආයෝජනය කරන මුදල ආපසු ලබා ගැනීම සහ අපේක්ෂිත ප්‍රතිලාභ නිශ්චිත ද යන්න මෙහි දී සලකා බැලේ.



රූපය 8.1

P ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ

ආයෝජනය සඳහා ලැබෙන ඉපැයීම ප්‍රමාණවත් ද යන්න මෙහි දී සලකා බැලේ. පුද්ගලයකු ආයෝජනය තුළින් දරන අවදානමට අදාළ ව සාධාරණ ප්‍රතිලාභයක් අපේක්ෂා කරයි.

## 8.3 විවිධ ආයෝජන මාර්ග

පුද්ගලයන්ට ආයෝජන සිදු කළ හැකි විවිධ මාර්ග ඇති අතර ඉන් කිහිපයක් පහත දැක්වේ.

P ඉතිරි කිරීමේ ගිණුමක මුදල් තැන්පත් කිරීම
P ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම
P දේපළ මිල දී ගැනීම
P කොටස්වල ආයෝජනය කිරීම
P භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීම
P තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන යාම



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## 8.4 ආයෝජන මාර්ගවල ප්‍රතිලාභ

### ඉතිරි කිරීමේ ගිණුමක මුදල් තැන්පත් කිරීම

ආයෝජන මාර්ගයක් ලෙස පුද්ගලයෙකුට තම අතිරික්ත මුදල් බැංකු හා වෙනත් මූල්‍ය ආයතනයන්හි ඉතිරි කිරීමේ ගිණුම්වල තැන්පත් කළ හැකි වේ.

ඉතිරි කිරීමේ ගිණුමක ලක්ෂණ හා එම ගිණුම් ආරම්භ කරන ආකාරය ඔබ මේ වන විටත් අධ්‍යයනය කර ඇත. ආයෝජන මාර්ගයක් ලෙස ඉතිරි කිරීමේ ගිණුමක මුදල් තැන්පත් කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ පහත සඳහන් පරිදි වේ.

- තැන්පතු සඳහා පොලී ආදායමක් හිමි වීම
- ත්‍යාග හෝ ලොතරැයි දිනුම් ඇදීම ආදිය මගින් අමතර ප්‍රතිලාභ ලැබිය හැකි වීම

### ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම

යම් පුද්ගලයෙකු යම් නිශ්චිත මුදල් ප්‍රමාණයක්, නිශ්චිත පොලියක් යටතේ, නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා තැන්පත් කරමින් ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම ද ආයෝජන මාර්ගයක් ලෙස සැලකේ.

ස්ථාවර තැන්පතු ගිණුමක ලක්ෂණ හා එම ගිණුම් ආරම්භ කරන ආකාරය ඔබ මේ වන විටත් අධ්‍යයනය කර ඇත. ආයෝජන මාර්ගයක් ලෙස ස්ථාවර තැන්පතුවක මුදල් තැන්පත් කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ පහත සඳහන් පරිදි වේ.

- ඉතුරුම් ගිණුමකට සාපේක්ෂ ව ඉහළ අනුපාතයක් යටතේ පොලී හිමිවීම
- කල් පිරුණු පසු හෝ ඊට පෙර හෝ අවශ්‍ය නම් මුදල් ආපසු ලබා ගත හැකි වීම
- ස්ථාවර තැන්පතු සහතිකය ඇපයට තබා ණය මුදලක් ලබාගත හැකි වීම
- සුරක්ෂිත ආයෝජන මාර්ගයක් වීම

### දේපළ මිල දී ගැනීම

ඉඩම්, ස්වර්ණාභරණ, වාහන, නිවාස වැනි දේපළ මිල දී ගැනීමට මුදල් යෙදවීම ද එලදායී ආයෝජන මාර්ග වේ.

මෙවැනි දේපළ මිල දී ගැනීම සඳහා තම මුදල් යෙදවීමෙන් පුද්ගලයෙකුට පහත සඳහන් ප්‍රතිලාභ ලැබිය හැකි වේ.

- ස්ථාවර වත්කම් හිමිකරුවෙකු වීම නිසා දේපළ පරිහරණය කිරීමේ හැකියාව ලැබීම
- දේපළ කුලියට හෝ බද්දට දීමෙන් හෝ උකස් කිරීමෙන් ආදායම් ඉපැයිය හැකි වීම
- මුදල් අවශ්‍යතාවක් ඇති වුවහොත් දේපළ විකුණා මුදල් ලබාගත හැකි වීම
- මිල දී ගත් මුදලට වඩා වැඩි මුදලකට විකිණීමෙන් ප්‍රාග්ධන ලාභ ඉපැයීමේ හැකියාව ලැබීම
- ණය මුදලක් ලබා ගැනීමේ දී ඇප සුරැකුම් ලෙස ඉදිරිපත් කළ හැකි වීම

### කොටස්වල ආයෝජනය කිරීම

සීමිත සමාගමක හිමිකම සමාන පංගුවලට බෙදුවහොත් ඉන් එක් පංගුවක් කොටසක් ලෙස හඳුන්වයි. සමාගමක් ප්‍රාග්ධනය රැස් කරන්නේ කොටස් නිකුත් කිරීම මගිනි. ආයෝජකයන් විසින් එම කොටස් මිල දී ගැනීමෙන් සිදු කරන්නේ තම මුදල් එම සමාගම්වල ආයෝජනය කිරීමයි. සමාගමක් විසින් විවිධ වර්ගවල කොටස් නිකුත් කරනු ලැබේ. එම වර්ග අතරින් වඩාත් වැදගත් වන්නේ සාමාන්‍ය කොටස් ය. සාමාන්‍ය කොටස් මිල දී ගන්නා ආයෝජකයන්ට සමාගමේ හිමිකම ලැබේ.



*8.2 රූපය කොටස් වෙළෙඳපළක දර්ශනයක්*

ඒ අනුව සාමාන්‍ය කොටස් මිල දී ගැනීමෙන් ආයෝජකයා සමාගමේ අයිතිකරුවෙකු බවට පත් වන අතර එම සමාගමෙහි අධ්‍යක්ෂවරු පත් කිරීමේ දී ඡන්දය පාවිච්චි කිරීමට ද බලය හිමි වේ.

**සාමාන්‍ය කොටස් හි ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ පහත පරිදි දැක්විය හැකි ය.**

- මිල දී ගත් කොටස් සඳහා ලාභාංශ ආදායම් ලැබිය හැකි වීම
- ගත් මිලට වඩා වැඩි වටිනාකමකට විකිණීමෙන් ප්‍රාග්ධන ලාභ උපයාගත හැකි වීම
- ඕනෑම අවස්ථාවක සාමාන්‍ය කොටස් අලෙවිකර මුදල් ලබා ගැනීමට හැකි වීම
- ණය ලබා ගැනීමේ දී ඇප සුරැකුම් ලෙස ඉදිරිපත් කළ හැකි වීම
- ඡන්දය භාවිත කර අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමේ හැකියාව
- අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වීම මගින් සමාගමට සම්බන්ධ තීරණ ගැනීමට දායක විය හැකි වීම

සමාගමක් කොටස් නිකුත් කිරීමේ දී ආයෝජකයන් විසින් ඒවා මිලට ගැනීමත් එසේ මිලට ගත් කොටස් තමාට අවශ්‍ය වූ විටක වෙනත් අයට විකිණීමත් ආශ්‍රිත ව නිර්මාණය වූ වෙළෙඳපළ කොටස් වෙළෙඳපළ ලෙස හඳුන්වයි. මෙසේ සමාගමකින් මිලදී ගත් කොටස් වෙනත් අය සමග හුවමාරු කිරීමේ දී එම වෙළෙඳපළ ගනුදෙනු මෙහෙයවන්නේ කොළඹ කොටස් හුවමාරුව මගින් ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාව

කොළඹ කොටස් වෙළෙඳපළ කටයුතු අධීක්ෂණය හා විධිමත් කිරීම පිණිස පාර්ලිමේන්තු පනතක් යටතේ ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාව පිහිටුවා ඇත. ආයෝජකයන් ආරක්ෂා කිරීමේ අරමුණ ඇති ව කොටස් වෙළෙඳපළ කටයුතු විධිමත් ව හා සාධාරණ ව පවත්වාගෙන යාම මෙම ආයතනයේ ප්‍රධාන අරමුණ වේ.

## භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම

භාණ්ඩාගාර බිල්පත් යනු රජයේ කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන කෙටිකාලීන සුරැකුම්පත් වර්ගයකි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් පළමුව නිකුත් කරනුයේ ලියාපදිංචි ප්‍රාථමික වෙළෙඳුන් වෙත ය. යම් ආයෝජකයෙකුට භාණ්ඩාගාර බිල්පත් මිල දී ගත හැකි වන්නේ මෙම ප්‍රාථමික වෙළෙඳුන්ගෙනි. බොහෝවිට ප්‍රාථමික වෙළෙන්දන් වශයෙන් කටයුතු කරන්නේ බලපත්‍රලාභී වාණිජ බැංකු ය. භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරනුයේ මාස තුනකින්, මාස හයකින් හෝ වර්ෂයකින් පරිණත වන ලෙසට ය.

භාණ්ඩාගාර බිල්පත්වල ලක්ෂණ හා එම බිල්පත්වල ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ පහත දැක්වෙන පරිදි වේ.

- ස්ථාවර ප්‍රතිශතයක් යටතේ පොලී ආදයමක් ලබාගත හැකි වීම
- ඕනෑම අවස්ථාවක දී මුදල් බවට පත් කළ හැකි වීම
- ආයෝජනය කළ මුදල ආපසු ලැබීම සම්බන්ධයෙන් පූර්ණ රාජ්‍ය ආරක්ෂාවක් හිමි වීම

### ක්‍රියාකාරකම 01

***කමල් රණතුංග මහතා විශ්‍රාමික රාජ්‍ය සංස්ථා නිලධාරියෙකි. ඔහුට ඔහුගේ අර්ථසාධක අරමුදල ඉදිරි දින කිහිපයේ දී ලැබීමට නියමිත ය. ඔහු මෙතෙක් ඉතිරි කරගත් මුදලක් නොමැති අතර වෙනත් ආදායම් මාර්ග ද නොමැත. ඉදිරියේ දී ඔහුට ජීවත් වීමට අවශ්‍ය නිශ්චිත මෙන්ම ඉහළ මාසික ආදායමක් ලබාගත හැකි හා තම මුදලට ආරක්ෂාව ලැබෙන ආයෝජන මාර්ගයක තම අර්ථ සාධක අරමුදල ආයෝජනය කිරීමට ඔහු අපේක්ෂා කරයි.***

ඉහත තොරතුරු අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. කමල් රණතුංග මහතාගේ අර්ථසාධක අරමුදල ආයෝජනය කිරීම සඳහා සුදුසු මාර්ගයක් යෝජනා කරන්න.

2. එම ආයෝජන මාර්ගය යෝජනා කිරීමට හේතු වූ කරුණු පැහැදිලි කරන්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 02

ස්ථාවර හෝ ඉතිරි කිරීමේ ගිණුමක මුදල් තැන්පත් කිරීමට වඩා දේපළ මිල දී ගැනීම සඳහා මුදල් යෙදවීම වාසි සහගතය.

ඉහත ප්‍රකාශයට පක්ෂ ව හා විපක්ෂ ව කරුණු ඉදිරිපත් කරන්න.

## ක්‍රියාකාරකම 03

පහත දැක්වෙන ප්‍රකාශ කියවා එම ප්‍රකාශවල නිවරද්‍යතාවට වඩාත් ගැළපෙන තීරුවෙහි ( ✓ ) ලකුණ යොදන්න.

| අංකය | ප්‍රකාශය | සාමාන්‍ය කොටස් | භාණ්ඩාගාර බිල්පත් |
|---|---|---|---|
| 01 | සීමාසහිත සමාගම් විසින් නිකුත් කරනු ලබයි. | | |
| 02 | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබයි. | | |
| 03 | ආයෝජනයේ ප්‍රතිලාභ ලෙස ලාභාංශ හිමි වේ. | | |
| 04 | පූර්ණ රාජ්‍ය ආරක්ෂාවක් ඇති ආයෝජන මාර්ගයකි. | | |
| 05 | ආයෝජනය සඳහා පොලී ආදායමක් ලබා ගත හැකි ය. | | |
| 06 | ආයෝජනය මගින් සමාගමක හිමිකරුවෙකු බවට පත් වේ. | | |
| 07 | ආයෝජනය වෙනුවෙන් ලැබෙන ප්‍රතිලාභය ස්ථාවර ප්‍රතිශතයක් නොවේ. | | |
| 08 | වර්ෂයක් හෝ ඊට අඩු කාලයක දී කල් පිරේ. | | |

(මෙම පොතෙහි දැක්වෙන සියලු ම පින්තූර අන්තර්ජාලය ඇසුරෙන් උපුටා ගන්නා ලදි.)



නොමිලේ බෙදා හැරීම සඳහා ය.